# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.10 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2025/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

## 01. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මීටියාගොඩ පොලිස් ස්ථානය.

2025.11.09 වන දින දහවල් කාලයේ මිටියාගොඩ පොලිස් වසමේ සීනිගම ප්‍රදේශයේදී මිටියාගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් කිලෝ 06 ග්‍රෑම් 534 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 42 ක් වන සීනිගම, හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මිටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. දිය අනතුරකින් විදේශ ජාතිකයෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය අහුංගල්ල.

2025.11.09 වන දින දහවල් කාලයේ අහුංගල්ල පොලිස් වසමේ අහුංගල්ල වෙරළ තීරයේ දිය නෑමට ගිය විදේශ ජාතිකයෙකු දිය වැළකට හසුව මුහුදට ගසාගෙන යමින් සිටියදී, වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි අහුංගල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් පරීක්ෂක මනෝජ් ආරියරත්න, පොලිස් කොස්තාපල් 29896 ලසන්ත, පොලිස් කොස්තාපල් 25505 එරන්ද සහ පොලිස් කොස්තාපල් 103992 දුලංජය  යන නිලධාරීන් විසින් එම පුද්ගලයා බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**අනතුරටපත් පුද්ගලයා වයස අවුරුදු 19 ක් වන නෝර්වේ ජාතිකයෙකු වේ.**

එම අවස්ථාවට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

## 03. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - මිනුවන්ගොඩ පොලිස් වසම.

2025.11.09 වන දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ අළුතැපොල ප්‍රදේශයේ ක්‍රීඩා පිටියක ක්‍රිකට් තරඟයක් අතරතුර සිදු වූ අනතුරකින් පුද්ගලයෙකු තුවාල ලබා මිනුවන්ගොඩ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී, මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත මිනුවන්ගොඩ පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ පළුගහවෙල, කටුවැල්ලේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තරඟය අතරතුර උඩපන්දුවක් රැකීමට යෑමේදී දෙදෙනෙකු එකිනෙකාගේ ගැටී මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මිනුවන්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. නාඳුනන පිරිමි මෘත ශරීරයක් හමුවීම - හලාවත පොලිස් වසම.**

2025.11.09 වන දින රාත්‍රී කාලයේ හලාවත පොලිස් වසමේ තාලඩිය වැල්ල වෙරළ තීරයේ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට හලාවත පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් පමණ වන උස අඩි 05 අඟල් 06 ක් වූ තළෙළු කෙට්ටු සාමාන්‍ය සිරුරක් ඇති, කොණ්ඩය කොටට කපා ඇති පුද්ගලයෙකි. රතු පැහැති කොට කලිසමක් හැඳ සිට ඇති අතර දකුණු අතෙහි බාහුවෙහි හඳුනාගැනීමට නොහැකි පච්චයක් කොටා ඇත.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - බෙම්මුල්ල පොලිස් වසම.**

2025.11.09 වන දින උදෑසන කාලයේ බෙම්මුල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ අලුත්ගම, බෝගමුව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරලී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කාර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු ගම්පහ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ කටුවස්ගොඩ, වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය ඥාතීන් වෙත භාරදී ඇති අතර කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බෙම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.**

2025.11.09 වන දින අළුයම් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ අනුරාධපුර පාදෙණිය මාර්ගයේ දිවුල්ලැව ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු හා පදික කාන්තාව ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 77 ක් වූ කොණ්ඩදෙණිය, කටුගස්තොට ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ පැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**